# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 13 දරන
# භාර ලදුපත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 13 දරන භාර ලදුපත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 6/89

**භාර ලදුපත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1990 අංක 13 දරන භාර ලදුපත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

86 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) භාර ලදුපත් ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (v) වන ඡේදයේ ඇති " නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වන පොරොන්දුවක් " යන වචන වෙනුවට " නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වන පොරොන්දුවක් ; " යන වචන ආදේශ කිරීමෙන්,

(2) එම උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (vi) රක්ෂණය කළ හැකි සියලුම අවදානම්වලට එරෙහිව භාණ්ඩ රක්ෂණය කළ හැකි සම්පූර්ණ වටිනාකමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් වන ආකාරයට ම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (v) ඡේදයේ ඇති " නියෝජිත ආයතනයට අවසරදීම සඳහා වන පොරොන්දුවක් " යන වචන වෙනුවට " නියෝජිත ආයතනයට අවසරදීම සඳහා වන පොරොන්දුවක් ; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (vi) එම භාණ්ඩ අපනයනය කරන තුරු, රක්ෂණය කළ හැකි සියලුම අවදානම්වලට එරෙහිව එම භාණ්ඩ රක්ෂණය කළ හැකි සම්පූර්ණ වටිනාකමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් වන ආකාරයටම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇති (iv) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(iv) භාර ලදුපත ලියා අත්සන් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා යම් කඩ කිරීමක් සිදු කරන්නේ නම් හෝ භාර ලදුපතේ සඳහන් වන පොරොන්දුවක් වන අවස්ථාවෝචිත පරිදි 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ (3) වන උප වගන්තියේ නැතහොත් 3 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුව කට එකඟව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් හෝ ඔහු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ නියෝජිත ආයතනයට ගෙවීමට ඇති හෝ අයවීමට ඇති මුදල බවට භාර ලදුපතේ සඳහන් වන මුදලට අඩු නොවන්නා වූ ද එම මුදලේ තුන්ගුණයට වැඩි නොවන්නාවූ ද මුදලක් දඩ වශයෙන් ගෙවීමට හෝ ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 4අ වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

'පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

4අ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම හෝ ලේකම්වරයකුම ද;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එම ව්‍යාපාර ආයතනයේ සෑම කොටස්කරුවකුම ද; සහ

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තෙක්ම ද

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුමක් නොමැතිව බවට හෝ එම වරද සිදුකිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ එම ව්‍යාපාර ආයතනයේ කොටස්කරු ඔප්පු කරන්නේ නම්, ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අනුමත ණය නියෝජිත ආයතන.

5. (1) මේ ආඥාපනතෙහි "අනුමත ණය නියෝජිත ආයතනය" යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලයලත් වාණිජ බැංකුවක්;

(ආ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව;

(ඈ) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව;

(ඉ) 6 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් සමාගමක් හෝ සමුපකාර සමිතියක් හෝ සම්බන්ධයෙන් ද, ඒ සමාගම හෝ සමුපකාර සමිතිය

අදහස් වේ;

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් යම් ආයතනයක් විසින් භාර ලදුපත් ලියා අත්සන් කිරීමේ ප්‍රතිඥාව වශයෙන් ණය දීමේ හෝ ණය පහසුකම් සැලසීමේ බලය, එම ආයතනය පිහිටුවීමේ සහ එම ආයතනය වෙත කාර්යය සහ කර්තව්‍ය පවරන පනත මගින් එම ආයතනය වෙත පවරනු ලැබ නැත්නම්, මේ පනතේ ඇති කිසිවකින් එසේ ණය දීමට හෝ ණය පහසුකම් සැලසීමට එම ආයතනයට බලය පවරන ලෙස සලකනු නොලැබිය යුතු ය; නැත හොත් එසේ බලය පවරන බවට තේරුම් නොගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් වගන්තියක් එකතු කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එකතු කරනු ලැබේ :—

" වාණිජ අධ්‍යක්ෂ වරයාගේ බලතල.

6. වාණිජ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය ස්ථාවරත්වයක් සහ තත්ත්වයක් ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සඳහන් නොකරන ලද කිසියම් සමූපකාර සමිතියකට හෝ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යයි ප්‍රකාශ කිරීම, ජාතික ආර්ථිකයේ යහපත පිණිස යෝග්‍ය වන්නේ යයි වාණිජ අධ්‍යක්ෂවරයා අදහස් කරන අවස්ථාවල, ඔහු විසින් එම විධිවිධාන එසේ අදාළ විය යුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. ".

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා **ලබාගත හැකිය.**